# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2406/32 – 2024 ඔක්තෝබර් මස 20 වැනි ඉරිදා – 2024.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/22.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.06.10 දිනැති හා අංක 2388/07 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.06.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බොරැල්ල, ලෙස්ලි රණගල මාවත, අංක 150/සී හි පදිංචි ආර්. කේ. ඩී. ගුණවංශ මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, කඩුවෙල පාර, රන්මගපාය, අංක 89 හි පිහිටි බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A 25/2024 හා 2024.09.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 042916 – 18 (2024/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

යොමු අංකය : IR/COM/02/2021/22
නඩු අංකය : A/25/2024
බේරුම්කරු : නීතිඥ සී. ඒ. එච්. එම්. විජේරත්න.

ආර්. කේ. ඩී. ගුණවර්ධන මයා,
අංක 150 / සී,
ලෙස්ලි රණගල මාවත,
බොරැල්ල.

*පළමු පාර්ශ්වය*

*එදිරිව*

බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,
අංක 89,
රන්මග පාය,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

*දෙවැනි පාර්ශ්වය*

ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත දක්වෙන කාර්මික ආරාවුලට හේතු පාදක වී පවත්නා කරුණු වනුයේ.

"බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් එම අධිකාරිය යටතේ මාර්ග පරීක්ෂක VI ශ්‍රේණියේ සේවය කරන ලද ආර්. කේ. ඩී. ගුණවංශ මහතාට එම අධිකාරියේ සමාන ශ්‍රේණියේ පත්වීම් ලැබූ අනිකුත් නිලධාරීන්ට ලබා දී ඇති පහත සඳහන් වැටුප් ප්‍රමාණයන් හිඟ වැටුප් සමග ලබා නොදීම යුක්ති සහගත ද යන්න හා නොඑසේනම්, ඔහුට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව වේ."

- 1995 අප්‍රේල් මාසයේ සිට ලැබිය යුතු රුපියල් 3300ක මාසික වැටුප් ප්‍රමාණය
- 1997 අංක 2/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි වැටුප් පරිවර්තනය කිරීමේදී 1996.12.31 වැනි දින වන විට ලබමින් සිටි බවට සැලකූ රුපියල් 4320ක මාසික වැටුප් පරිමාණය
- එම චක්‍රලේඛනය පරිදි 1998.01.01 දින සිට ලැබිය යුතු රුපියල් 5420ක මාසික වැටුප් පරිමාණය හා
- 2003.01.01 දින සිට ලැබිය යුතු රුපියල් 6030ක මාසික වැටුප් පරිමාණය

**පරීක්ෂණ ක්‍රියාවලිය.-**

2024.07.01 දින මෙම බේරුම්කරණ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර, දෙපාර්ශ්වය විසින් පිළිගනු ලැබූ විසඳිය යුතු කරුණු හඳුනාගෙන සීමිත වාචික සාක්ෂි විමසීම හැර අනෙකුත් කරුණුවලට අදාළ සාක්ෂි දිවුරුම් ප්‍රකාශ හා ලිඛිත දේශන මගින් කරුණු දෙපාර්ශ්වයෙන්ම ලබා ගන්නා ලදී.

ඒ අනුව විසඳිය යුතු ප්‍රශ්න ලෙස පහත කරුණු නිරීක්ෂණය විය.

(1) පළමු පාර්ශ්වයේ මෙම ඉල්ලීමට පාදක වී ඇත්තේ දෙවන පාර්ශ්ව ආයතනයෙහි සමාන තනතුරක සේවය කරන අනුර දේශප්‍රිය අලස් මහතා වෙනුවෙන් ලබා දී තිබෙන නඩු අංක A 3025 දරන 2009 ජනවාරි මස 08 වැනි දින ගැසට් පත්‍රයෙහි පළ කරන ලද බේරුම් කරන තීන්දුවයි.

එම නිසා විසඳිය යුතු ප්‍රශ්නය වූයේ එම ආයතනයෙහි සේවය කරන ලද ඒ. ඩී. අලස් මහතා හා මෙම නඩුවේ පළමු පාර්ශ්වය වන ආර්. කේ. ඩී. ගුණවංශ මහතා අතර සමාන කමක් තිබුණේ ද? එසේනම් අලස් මහතාට ලැබුණු දීමනා, වරප්‍රසාද, ගුණවංශ මහතා සම්බන්ධයෙන් අදාළ කර නොගත යුත්තේ මන් ද?

(2) අලස් මහතා හැරුණුකොට පළමු පාර්ශ්වය වන ගුණවංශ මහතා සමග සම ශ්‍රේණියේ සේවය කරන ලද තවත් සේවක මහත්ම මහත්මීන් සිටින්නේ ද? ඔවුන් හට ලබා දී තිබෙන වැටුප් හා වරප්‍රසාද කවරේ ද? එම වැටුප් හා වරප්‍රසාද ගුණවංශ මහතාට ලබා දුන් වැටුප් හා වරප්‍රසාද හා සම නොවන්නේ නම් එසේ වීමට හේතු සාධක මොනවාද ?

**අලස් මහතාගේ බේරුම්කරණය සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු.-**

(1) ඒ. ඩී. අලස් මහතා 1987.03.09 වැනි දින සිට අංක 01 ගම්පහ දිස්ත්‍රික්කයේ පෞද්ගලික බස් රථ ධාවකයින්ගේ සමිතියේ මාර්ග පරීක්ෂකවරයෙකු ලෙස පත්වීම ලැබ එම සමිතියෙන් නිකුත් කරන ලද 1989.03.08 දිනැති ලිපිය මගින් එම තනතුරේ ස්ථිර කර ඇති 1992.05.12 දින සිට ක්‍රියාත්මක වෙන පරිදි බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ දෙවන ශ්‍රේණියේ පරීක්ෂක නිලධාරියකු ලෙස පත්වීම් ලබා ඇත.

(2) 1992.05.05 දින සිට අධිකාරිය වෙත පත්කර ගැනුණු පෞද්ගලික බස් රථ ධාවකයින්ගේ සමිතිවල සේවකයින්ට එම තනතුරුවල පෙර සේවා කාලය සැලකිල්ලට ගෙනෙන ලෙස 1995.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් ප්‍රතිශෝධනය කර ඇති නමුත් ඒ. ඩී. අලස් මහතා 1987.03.09 දින සිට මාර්ග පරීක්ෂක තනතුරේ සේවයෙහි යෙදී තිබියදී ඒ මහතා 1992.05.05 දිනැතිව පරිපාලන දෝෂයක් නිසා එය 1992.05.12 ලෙස සටහන් වී තිබීම අනුව අදාළ වැටුප් ප්‍රතිශෝධනය අලස් මහතා සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවී තිබිණි. ඒ අනුව අලස්ගේ පත්වීම 1992.05.05 දින සිට සිදු වූ ලෙස සලකා අනිත් පරීක්ෂකවරුන්ට ලබා දෙන ලද සහන සහ වරප්‍රසාද අලස්ට ද ලබා දිය යුතු බව බේරුම්කරු තීරණය කරන ලදී.

නමුත් ගුණවංශ මහතා සමිති සේවා කාලය තුළ දී වේලා සටහන්කරුවෙකු ලෙස සේවය කළ නිසා 1992.05.05 දින සිට බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ වේලා සටහන්කරු තනතුරකට පත්කළ බැවින් සමාන තනතුරක සමාන ශ්‍රේණියක නිලධාරීන් භුක්ති විඳි වැටුප් වරප්‍රසාද ඊට පහළ ශ්‍රේණියක වෙනත් තනතුරකට බඳවා ගන්නා ලද සේවකයකුට ඉල්ලුම් කළ නොහැකි බවයි.

ගුණවංශ මහතා සාක්ෂි ඉදිරිපත් කරමින් කියා සිටියේ තමන්ගේ පත්වීම වේලාසටහන්කරු වුවද මාර්ග පරීක්ෂක තනතුරේ වැඩ බලන ලද බවත් ඒ නිසා තමාට නීතිමය ගැටලු පවා ඇති වූ බවයි. කෙසේ වුවද එම කරුණු සනාථ කිරීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවිණි.

තවදුරටත් ගුණවංශ මහතා ප්‍රකාශ කර සිටියේ සමිති මාර්ගස්ථ අධිකාරියට 1992.05.05 දින අන්තර්ග්‍රහණය කරන ලද අවස්ථාවේ දී තමාට එම ආයතනයට සම්බන්ධ වීමට නොහැකි වූයේ තමා වැටුප් රහිත නිවාඩු ලබාගෙන කොළඹ නැව් තටාංගයේ මෝටර්මන් කාර්මික පාඨමාලාවක් හදාරමින් සිටි නිසා බවයි. ඔහු නැවත සේවයට පැමිණියේ 1992.06.29 දිනයේ දී බවයි.

ගුණවංශ මහතා විසින් තවදුරටත් කරුණු දක්වමින් කියා සිටියේ පහත නිලධාරීන් දෙදෙනා තමා හා සමකාලීන පත්වීම් ලැබූ බවයි. එම නිසා ඔවුන් දෙදෙනා සම්බන්ධයෙන් ද විස්තර ඉදිරිපත් කරන ලෙස බේරුම්කරණය විසින් දෙවන පාර්ශ්වයට දන්වන ලදී. එයට හේතු වුණේ සමාන විය යුත්තන් අතර නීතිය යෙදවීම සමාන විය යුතුයි යන සිද්ධාන්තය මතයි. ඒ අනුව පාර්ශ්වය ඔවුන් සම්බන්ධයෙන් මෙලෙස කරුණු දක්වන ලදී.

1. *යූ. එල්. ආර්. පෙරේරා*

යූ. එල්. ආර්. පෙරේරා 1997.01.01 දින සිට ධාවකයින්ගේ සමිතියේ නැවතුම්පළ සහකරුවකු ලෙස සේවයට බඳවාගෙන ඇති අතර 1992.05.05 දින සිට මාර්ග පරීක්ෂක නිලධාරියකු ලෙස මෙම ආයතනයට බඳවා ඇති බවයි.

ආර්. කේ. ඩී. ගුණවංශ මහතා සමිති සේවා කාලය තුළ දී වේලා සටහන්කරුවකු ලෙස සේවයේ යෙදී සිටිනු ලැබූ 1992.05.05 දින සිට වේලාසටහන්කරුවෙකු ලෙස අධිකාරියේ පත්වීම් ලැබූ පසුව 1992.08.13 සිට මාර්ග පරීක්ෂක තනතුරට පත්කර ඇති බැවින් යූ. එල්. ආර්. පෙරේරා සමග සමකාලීන තනතුරක් දරූ බව සැලකිය නොහැකි බවයි.

2. *එම්. ජී. විමලසිරි*

එම්. ජී. විමලසිරි 1985.12.01 දින සිට කොළඹ දිස්ත්‍රික් පෞද්ගලික බස් රථ ධාවකයින්ගේ සමිතියේ වේලාසටහන්කරුවෙකු ලෙස සේවයට බඳවාගෙන ඇති බවයි.

එම සමිතියේ එවකට සභාපති විසින් විමලසිරි 1990.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජංගම වැටලීම් කටයුතුවලට යොදවා ඇති බවයි.

එම්. ජී. විමලසිරි 1992.05.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම අධිකාරියේ ස්ථාන පාලක නිලධාරි තනතුරකට පත්කර ඇති බවත් එවකට සභාපති එස්. බී. නෝට්න් ප්‍රෙඩ්රික් මහතා විසින් නිකුත් කර ඇති ලිපියක් මගින් මෙම අධිකාරියේද මාර්ග පරීක්ෂකයෙකු ලෙස තාවකාලිකව පත්කර ඇති බවයි.

සමිති සේවා කාලයේ සිට මාර්ග පරීක්ෂක තනතුරේ සේවයෙහි යොදවා තිබීම සැලකිල්ලට ගෙන එම්. ජී. විමලසිරි වෙත සමාන පියවරයන් සහිතව වැටුප් ප්‍රතිශෝධනය ලබා දී ඇති බව ද දෙවන පාර්ශ්වය සනාථ කරන ලදී.

පළමු පාර්ශ්වය වන ගුණවංශ මහතා විසින් ඔහු හා සමකාලීන ලෙස බී. ජී. ඒ. පියදාස, ඊ. ඩී. කුවින්ටස් හේවා සහ කේ. ඒ. සිසිර යන අයවලුන්ගේ නම් ඉදිරිපත් කරන ලද අතර වගඋත්තරකාර දෙවන පාර්ශ්වය සාක්ෂි ඉදිරිපත් කරමින් කියා සිටියේ සමිති සේවා කාලයට අදාළව පිරිනැමුණු වැටුප් ප්‍රතිශෝධනයන් 1992.05.05 දින වේලාසටහන්කරුවන් ලෙස මෙම අධිකාරියට පත් කරනු ලැබ සිට 1992.08.12 හා 1992.08.13 දිනැතිව මාර්ග පරීක්ෂක තනතුර ලැබූ ආර්. කේ. ඩී. ගුණවංශ මහතාට මෙන් වැටුප් හා දීමනා සමසේ අදාළ කරගෙන ඇති බවයි.

**සාක්ෂි විශ්ලේෂනය නිරීක්ෂණ හා නිගමනය.-**

(1) ආර්. කේ. ඩී. ගුණවංශ මහතා සමිති සේවා කාලයේ දී වේලාසටහන්කරු තනතුර දැරුවෙකු බැවින් අන්තර්ග්‍රහණය කිරීමේ දී 1992.05.05 දින සිට ක්‍රියාත්මක වන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ තුන්වන ශ්‍රේණියේ වේලා සටහන්කරු තනතුරකට පත් කරනු ලැබ ඇති බවට වග උත්තර පාර්ශ්වය සාක්ෂි ඉදිරිපත් කරන ලදී.

(2) තමා සමිති කාල සීමාව තුළ වේලාසටහන්කරු ලෙස පත්වීම ලැබ සිටිය ද වැඩබලන පදනම මත මාර්ග පරීක්ෂණ නිලධාරි තනතුරේ වැඩ බැලූ බව ප්‍රකාශ කළ ද ඒ බව සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකරන ලදී.

(3) කෙසේ වෙතත් අධිකාරිය විසින් 1992.08.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාර්ග පරීක්ෂක තනතුරේ ඔහු පිහිටුවා අදාළ වැටුප්, දීමනා ගෙවා ඇති බව සනාථ විය.

(4) 1992.05.05 දින සමිතියෙන් මාර්ගස්ථ අධිකාරිය පිහිටුවන අවස්ථාවේ දී ගුණවංශ මහතාට අධිකාරියට සම්බන්ධ වීමට නොහැකි වූයේ ඔහු ඒ අවස්ථාවේ දී වැටුප් රහිත නිවාඩු ලබා කොළඹ නැව් තටාංගනයේ වෘත්තිමය පාඨමාලාවක් හැදෑරූ නිසා බව ප්‍රකශ කරන ලදී. ඒ නිසා අධිකාරියක් පිහිටුවන බව ඔහු දැනගෙන නොසිටි බව ද ප්‍රකාශ කරන ලදී. එය ඔහුගේ අතපසුවීමක් මිස අධිකාරියේ දෝෂයක් ලෙස සැලකිය නොහැකියි.

(5) බේරුම්කරණ අධිකරණය විසින් ඔහුගෙන් විමසා සිටියේ මෙම පාඨමාලාව නිසා එම අධිකාරියට ඔහු විසින් විශේෂ සේවාවක් සපයන ලද්දේ ද යන්නයි. තමාගේ දැනුමින් අධිකාරිය ප්‍රයෝජනය ගත් බව ඔහු විසින් වාචිකව සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටිය ද ඒ පිළිබඳව සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකරන ලදී.

(6) ගුණවංශ මහතා විසින් තමාගේ සමකාලීනයන් ලෙස දන්වා සිටි පී. ටී. එල්. විතාන, ඒ. ඩී. අලස් සහ පී. වී. පී. පී. වික්‍රමරත්න යන අයවලුන් සමිති සේවා කාලයන්හි සිටම මාර්ග පරීක්ෂක තනතුරු දැරුවන් වූ බැවින් මැයි මාසය තුළ දී මෙම අධිකාරියට අන්තර්ග්‍රහණය කිරීමේ දී මාර්ග පරීක්ෂක තනතුරට පත්කර ඇති බැවින් ආර්. කේ. ඩී. ගුණවංශ මහතා සමග එකම වසරේ එකට පත්වීම් ලැබූවන් ලෙස සැලකීමට නොහැකි බවට වගඋත්තරකාර අධිකාරිය විසින් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කරන ලදී.

(7) තවද මෙම නඩුවේ ඉල්ලීමට ප්‍රධාන සාධක කොටගෙන තිබුණේ A/3025 බේරුම්කරණ තීරණයයි. එය ලබා දී තිබුණේ ඒ. ඩී. අලස් මහතා සම්බන්ධයෙනි. අලස් මහතා 1987.03.09 දින සිටම පෞද්ගලික බස් රථ සමිතියක මාර්ග පරීක්ෂක තනතුරේ පත්වීම ලැබ මෙම අධිකාරියට අන්තර්ග්‍රහණය කර ගැනීමේ දී 1992.05.12 දින සිට ක්‍රියාත්මක වන ලෙස දෙවන ශ්‍රේණියේ පරීක්ෂක නිලධාරියෙකු ලෙස පත්වීම ලබා ඇති බැවින් 1992 වන විට මාර්ග පරීක්ෂක තනතුරේ වසර පහකට අධික සේවා කාලයක් සපුරනු ලැබූ නිලධාරියකු බව සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් විය. අලස් මහතා වාචික සාක්ෂි දෙමින් කියා සිටියේ තමා හා ගුණවංශ මහතා අතර සම තත්ත්වයන් නොමැති බවයි.

(8) ඒ අනුව ගුණවංශ මහතා 1992.08.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාර්ග පරීක්ෂක තනතුරට පත්කර ඇති බැවින් මාර්ග පරීක්ෂක තනතුරේ 1992.05.05 දිනට පෙර සේවා කාලයක් නොතිබීමේ හේතුව මත A/3025 දරන බේරුම්කරණ තීරණය සඳහා පාදක කර ගැණුනු අන්තර්ග්‍රහණයට පෙර සේවා කාලය මත පදනම්ව සිදු කෙරෙනු 1995.01.01 වැටුප් ප්‍රතිශෝධනය ඒ මහතා සම්බන්ධයෙන් අදාළ කර ගැනීමට නොහැකි බවට සාක්ෂි ඉදිරිපත් කෙරුණි.

(9) එබැවින් අලස් මහතා නොව ගුණවංශ මහතාගේ සමකාලීන පත්වීම ලැබූවන් හට ලබා දුන් වැටුප් වර්ධක දීමනා පිළිබඳව විමසා බලන ලදී. ගුණවංශ මහතා විසින් 1992.08.13 වැනි දින සිට ක්‍රියාත්මක වන ලෙස මාර්ග පරීක්ෂක තනතුරට පත් කරන ලද අයවලුන් ලෙස බී. ජී. ඒ. පියදාස, ඊ. ඩී. කුවින්ටස් හේවා සහ කේ. ඒ. සිසිර යන අයවලුන්ගේ නම් සඳහන් කරන ලදී. ඔවුන් සම්බන්ධයෙන් ගුණවංශ මහතාට මෙන් සමාන වැටුප්, දීමනා වැටුප් වර්ධක ලබා දී ඇති බව සනාථ කරන ලදී.

**නිගමනය**

ඒ අනුව ගුණවංශ මහතාගේ සමිති කාලය තුළ දරන ලද තනතුරු සහ ඔහු විසින් අධිකාරියට සම්බන්ධ වීමේ දිනය සැලකිල්ලට ගෙන ඔහුට හිමි විය යුතු සියලුම වැටුප්, වැටුප් වර්ධක හා දීමනා වගඋත්තරකාර අධිකාරිය විසින් ගෙවා ඇති බව නිගමනය කරමි.

මෙම නඩුවේ ඉල්ලීමට පාදක කරගෙන ඇති A/3025 බේරුම්කරණ තීරණය මගින් අලස් මහතාට ලබා දී ඇති වැටුප් පියවරයන්ට හිමිකම් කීමට පළමු පාර්ශ්වය වන ගුණවංශ මහතාට හිමිකමක් නොමැති බවට ද නිගමනය කරමි.

ඉහත දක්වන ලද නිගමනය සාධාරණ හා යුක්ති සහගත බව මම තරයේ විශ්වාස කරමි.

නීතිඥ සී. ඒ. එම්. එම්. විජයරත්න,
(බේරුම්කරු)

2024 සැප්තැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී අත්සන් තබන ලදී.

EOG 10 - 0154

මගේ අංකය: IR/COM/01/2018/266.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.01.03 දිනැති හා අංක 2156/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.12.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් 1. කෝට්ටේගොඩ, ප්‍රධාන පාර, ''ගයාෂාන්'' හි පදිංචි එම්. එම්. මොහාන් ඇන්තනී මයා 2. හුංගම, දකුණු බටඅත පදිංචි ඊ. කේ. ඒ. සිසිර මයා, 3. තංගල්ල, දංකැටිය, සඟබෝ මාවත, අංක 29 හි පදිංචි ඩබ්. පී. ආරියදස මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, මට්ටක්කුලිය, කාක දූපත හි පිහිටි ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2024.04.01 දිනැති අංක A01/2020 ප්‍රදානය පළ කරනු ලැබූ 2024.06.17 දිනැති හා අංක 2389/06 දරන ගැසට් නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම සඳහා 2024.09.13 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**2024 ජුනි මස 17 දින 2389/06 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම**

යොමු අංකය: IR/COM/01/2018/266.
නඩු අංකය: A/01/2020.

එම්. එම්. මොහාන් ඇන්තනී මයා
''ගයාෂාන්'',
ප්‍රධාන පාර,
කෝට්ටේගොඩ.

ඊ. කේ. ඒ. සිසිර මයා
දකුණු බට අත,
හුංගම.

ඩබ්. පී. ආරියදාස මයා
අංක 29,
සඟබෝ මාවත,
දංකැටිය,
තංගල්ල.

*(පළමු පාර්ශවය)*

ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය
කාක දූපත,
මට්ටක්කුලිය,
කොළඹ 15

*(දෙවන පාර්ශවය)*

අතර පැවති කාර්මික ආරවුල

**ප්‍රදාන පත්‍රයේ දෝෂ නිවැරදි කිරීම**

2024 ජුනි මස 17 වන දින ප්‍රසිද්ධ කරන ලද අංක 2389/06 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 11A පිටුවේ 3 වන ඡේදයේ 02 වන පේළියේ සඳහන් "මෙම ප්‍රදානය ගැසට් කර මාස හයක් ඇතුළත කොළඹ කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු අතර" යන්න "මෙම ප්‍රදානය ගැසට් ගතකර මාස හයක් ඇතුළත උතුරු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු අතර" ලෙස සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

තව ද එම ප්‍රදානයේ ඇතුළත් අනෙකුත් කරුණුවල වෙනසක් නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

**කේ. කේ. කේ. ධනපාල,**
බේරුම්කරු.

2024 සැප්තැම්බර් මස 13 වැනි දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

EOG 10 – 0155

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.